විෂය Subject - දේශීය නර්තනය Oriental Dance

ශ්‍රේණිය Grade - 11

කාලච්ඡේද Periods - 60

| | **නිපුණතාව** | **ක්‍රියාකාරකම** | **අත්‍යාවශ්‍ය ඉගෙනුම් පල** | **විෂය අන්තර්ගතය** | **කාලච්ඡේද** |
|---|---|---|---|---|---|
| 10 ශ්‍රේණිය<br>11 වාරය | 2.0<br>නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | **2.3.1**<br>**වන්නම් නර්තනය කරමු.** | ▪ අදාල තිත් රූපය අනුව සැවුලා/ නාතිලිංචිතාලය/ මණ්ඩූක වන්නම්වල තානම් හා කවි නියමිත නාදමාලා අනුව ගායනව කරයි.<br>▪ තානම හා කවි ගයමින් පද නර්තනය කරයි.<br>▪ කස්තිරම/ ඉරට්ටිය/ කලාසම, සීරුමාරුව, අඩව්ව නර්තනයේ යෙදෙයි.<br>▪ වාදනයට අනුව සම්පූර්ණ වන්නම නර්තනය කරයි. | • වන්නම් නර්තනය (සැවුලා/ නාතිලිංචිතාලය/ මණ්ඩූක වන්නම) | 02 |
| | 2.0<br>නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | **2.4.1**<br>**බෙර පද හා කවි ප්‍රස්තාර කරමු.** | ▪ නියමිත කවි ගායන සහ නර්තන පද ප්‍රස්තාර කිරීමේ විධික්‍රම සාකච්ඡා කරයි.<br>▪ විධික්‍රම හා විවිධ ශිල්පක්‍රම භාවිත කරමින් අදාළ කවි හා නර්තන පද කොටස් ප්‍රස්තාර කරයි.<br>▪ නිවැරදිව ප්‍රස්තාරකරණයේ යෙදෙමින් තාල පිළිබඳ ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.<br>▪ තුන් තිතේ ප්‍රභේද හඳුන්වයි. | • බෙර පද හා කවි පද ප්‍රස්තාරය (වන්නම්, රබන් හා චාමර කවි) | 02 |
| | 5.0<br>ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම | **5.3.1**<br>**සොකරි ගැමි නාටක පිළිබඳ තතු විමසා බලමු.** | ▪ සොකරි දේශීය ගැමි නාටකයක් බව ප්‍රකාශ කරයි.<br>▪ සොකරි නාටකය ප්‍රචලිත ප්‍රදේශ හා පැවැත්වීමේ අරමුණු විස්තර කරයි.<br>▪ සොකරි කථා ප්‍රවෘත්තිය හා චරිත නිරූපණ පිළිබඳ විචාරාත්මකව අදහස් දක්වයි. | • සොකරි ගැමි නාටකය<br>• කතා පුවත, චාරිත්‍ර, ගායන, වාදන, නර්තන සහ රංගවස්ත්‍රාභරණ | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි. | | ▪ ගැමි නාටක අභාවයට යා නොදී ආරක්ෂා කරගැනීමට යෝජනා ඉදිරිපත් කරයි. | | |
| | 6.0<br>රසඥතා වර්ධනව සඳහා විවිධ කලාංගවල සුවිශේෂී ලක්ෂණ විචාරයට ලක් කරයි. | **6.2.1**<br>**කලා කෘතියක එස මිහිර පවසමු.**<br>**(කරදිය/ කුඹී කතාව)** | ▪ මුද්‍රා නාට්‍යයට පාදක වූ කතා පුවත විස්තර කරයි.<br>▪ කතා පුවතින් විද්‍යමාන ජීවන දැක්ම විස්තර කරයි.<br>▪ චරිත විකාශය සඳහා නර්තන යොදාගෙන ඇති ආකාරය පිළිබඳඅදහස් දක්වයි.<br>▪ කලාත්මක ලක්ෂණ තීව්‍ර කිරීම සඳහා සංගීතය, රංග වස්ත්‍රාභරණ, වේදිකා සැරසිළි, ආලෝකකරණය ආදිය යොදාගෙන ඇති ආකාරය විචාරාත්මක ව ඇගයීමට ලක් කරයි. | • කරදිය/ කුඹී කතාව මුද්‍රා නාට්‍ය තේමාව, චරිත, රංගවස්ත්‍රාභරණ, නර්තනය, සංගීතය හා පසුතල නිර්මාණ | 02 |
| | 4.0<br>ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනවල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි. | **4.2.1**<br>**රබන්, ඔංචිලි වාරම්, චාමර කවි ගයමු.** | • රබන්, ඔංචිලි වාරම්, චාමර කවි නිවැරදි නාදමාලා අනුව තාල තබමින් ගායනය කරයි.<br>• බෙර වාදනයට අනුව තාල තබමින් රබන්, ඔංචිලි වාරම්, චාමර කවි ගයනය කරයි.<br>• ඒකීය හඬතලය හා ස්වකීය හඬතලය හඳුනාගෙන කවි ගායනය කරයි. | • රබන්, ඔංචිලි වාරම් හා චාමර කවි | 02 |
| 10 ශ්‍රේණිය<br>111 වන වාරය | 2.0<br>නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | **2.5.1**<br>**සතර අභිනය** | ▪ ප්‍රකාශන විධික්‍රම ලෙස සතර අභිනය භාවිත වන බව ප්‍රකාශ කරයි.<br>▪ සතර අභිනය විස්තර කරයි.<br>▪ ප්‍රේක්ෂක රස වින්දනය උදෙසා සතර අභිනය වැදගත් වන බව ප්‍රකාශ කරයි. | • ආංගික, වාචික, සාත්වික හා ආහාර්ය අභිනය | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 5.0<br>ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි. | **5.2.1**<br>**නර්තන ප්‍රවර්ධනයට දායක වූවන් අගයමු.** | ▪ නර්තන ශිල්පිනියන් පිළිබඳ ජීවන තොරතුරු රැස්කරයි.<br>▪ නර්තන ප්‍රවර්ධනයට දායක වී ඇති ආකාරය විස්තර කරයි.<br>▪ ඔවුන්ගේ සේවය ඇගයීම සම්බන්ධ ව අදහස් දක්වයි.<br>▪ පරපුරෙන් පරපුරට ඔවුනට දැක්විය යුතු කෘතවේදීත්වය පිළිබඳ ව යෝජනා ඉදිරිපත් කරයි. | • නර්තනයේ ප්‍රවර්ධනයට කාන්තා දායකත්වය (ආචාර්ය වජිරා චිත්‍රසේන මිය, මිරැන්ඩා හේමලතා මිය) | 02 |
| | 5.0<br>ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි. | **5.4.1**<br>**කොහොඹා යක් කංකාරිය, දෙවොල්මඩුව හා පහන් මඩුව ශාන්තිකර්ම පිළිබඳ තොරතුරු තුලනාත්මකව ඉදිරිපත් කරමු.** | ▪ කොහොඹා යක් කංකාරිය, දෙවොල්මඩුව හා පහන් මඩුව ශාන්තිකර්ම හා සබැඳි කතා පුවත්වල අන්තර්ගත සමාජ ආකල්ප විස්තර කරයි.<br>▪ එම ශාන්තිකර්ම පැවැත්වීමේ අරමුණු දක්වයි.<br>▪ එම ශාන්තිකර්මවල අන්තර්ගත ගායන, වාදන, නර්තන, රංග වස්ත්‍රාභරණ, සැරසිලි හා රංග භාණ්ඩවල ලක්ෂණ තුලනාත්මකව ඉදිරිපත් කරයි. | • කොහොඹා යක් කංකාරිය, දෙවොල්මඩුව හා පහන් මඩුව ශාන්තිකර්මවල කතා පුවත, නර්තන, ගායන, වාදන, රංගවස්ත්‍රාභරණ, සැරසිලි හා රංග භාණ්ඩවල සුවිශේෂ ලක්ෂණ | 03 |
| | 6.0<br>රසඥතා වර්ධනව සඳහා විවිධ කලාංගවල සුවිශේෂී ලක්ෂණ විචාරයට ලක් කරයි. | **6.3.1**<br>**කථකලි නර්තනයේ තතු විමසමු.** | ▪ කථකලි යන්න අර්ථ දක්වයි.<br>▪ කථකලි ප්‍රචලිත ප්‍රදේශ හා ඒ හා බැඳි සුවිශේෂ ආයතන නම් කරයි.<br>▪ කථකලි සංගීත සම්ප්‍රදාය හා වාද්‍ය භාණ්ඩ නම් කරයි.<br>▪ මෙම නර්තන සම්ප්‍රදාය ආහාර්ය අභිනයෙන් පොහොසත් බවට අදහස් ප්‍රකාශ කරයි. | • කථකලි නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ, නර්තනය, සංගීතය, වාද්‍ය භාණ්ඩ, රංගවස්ත්‍රාභරණ හා අංග රචනය | 02 |
| | 6.0<br>රසඥතා වර්ධනව සඳහා විවිධ කලාංගවල සුවිශේෂී ලක්ෂණ විචාරයට ලක් කරයි. | **6.1.1**<br>**ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය (ඉගිනළු) කලාවේ ප්‍රභවයට බලපෑ කරුණු** | ▪ ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය (ඉගිනළු) යන්න පැහැදිලි කරයි.<br>▪ ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය (ඉගිනළුවල) සුවිශේෂ ලක්ෂණ විමසයි. | • ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය කලාව පිළිබඳ තොරතුරු හැඳින්වීම, ආරම්භය හා විකාශය (1930- 1960 දශකය) | 03 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ▪ ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය (ඉගිනළු) කලාවේ ආරම්භය හා විකාශනය පිළිබඳ කරුණු ඉදිරිපත් කරයි.<br>▪ ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය (ඉගිනළු) ප්‍රාසාංගික ව ඉදිරිපත් කිරීමට භාවිත කර ඇති විධි ක්‍රම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. | | |
| | | | | | 24 |
| 11 ශ්‍රේණිය<br>1 වන වාරය | 2.0<br>නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | **2.2.1**<br>**සාම්ප්‍රදායික වන්නම් නටමු.** | ▪ මුසලඩි වන්නම/ ශුද්ධ තාලය සින්දු වන්නම/ කොවුලා වන්නමට අයත් කවි නියමිත නාදමාලාවට හා තාලයට අනුව ගායනය කරයි.<br>▪ මුසලඩි වන්නම/ ශුද්ධ තාලය සින්දු වන්නම/ කොවුලා වන්නමට අදාල පද නර්තනය කරයි.<br>▪ අදාල වන්නම්වල කස්තිරම/ කලාසම/ ඉරට්ටිය, සීරුමාරුව හා අඩව්ව නර්තනය කරයි.<br>▪ ගායනය කරමින් වාදනයට අනුව කණ්ඩායම් ලෙස නර්තනයේ යෙදෙයි.<br>▪ බෙර වාදනයට අනුව නියමිත අංගහාර සහිතව සම්පූර්ණ වන්නම නර්තනය කරයි. | ●සාම්ප්‍රදායික වන්නම් නර්තනය (මුසලඩි වන්නම/ ශුද්ධ තාලය සින්දු වන්නම/ කොවුලා වන්නම) | 02 |
| | 4.0<br>ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනවල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි. | **4.2.2**<br>**නියමිත ගායනාවල පසුබිම විස්තර කර නිවැරදි නාදමාලා අනුගමනය කරමින් ගායනා ඉදිරිපත් කරමු.** | ▪ නියමිත ගායනාවල පසුබිම විස්තර කරයි.<br>▪ එම ගායනවල භාෂාත්මක විග්‍රහය, අනන්‍යතා ලක්ෂණ හා ගායන අවස්ථා පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>▪ නියමිත නාදමාලා අනුගමනය කරමින් ගායන ඉදිරිපත් කරයි.<br>▪ සාමූහිකව ගායන ඉදිරිපත් කරයි.<br>▪ ගායන ප්‍රාසාංගිකව ඉදිරිපත් කරයි. | ● ජන ගායනාවල සමාජ සංස්කෘතික පසුබිම හඳුනා ගනිමින් නියමිත නාද මාලාවට අනුව ගායනය (ග්‍රහ පන්ති කවි, ප්‍රශස්ති කවි) | 02 |
| | 2.0<br>නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් | **2.3.1**<br>**ප්‍රස්තාරකරණයේ විධික්‍රම අනුගමනය කරයි.** | ▪ තුන් තිතේ ප්‍රභේද විස්තර කරයි.<br>▪ තුන් තිතේ ප්‍රභේද අනුව තාල තබයි.<br>▪ තුන් තිතේ ප්‍රභේද අනුව තාල තබමින් පද කියයි. | ● තුන් තිතේ ප්‍රභේද<br>● කඩු, මෝල් ගස්, ග්‍රහපන්ති කවි | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | | | | |
| | 5.0 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි. | **5.1.1** **වන්නම්වල පසුබිම හා විකාශනය අධ්‍යයනය කරමු.** | ▪ වන්නම් පිළිබඳ තොරතුරු ඇතුළත් ග්‍රන්ථ රචනා වී ඇති බව ප්‍රකාශ කරයි.<br>▪ වන්නම් නිර්මාණයට තුඩුදුන් හේතු සාකච්ඡා කරයි.<br>▪ වන්නම් පිළිබඳ ඓතිහාසික තොරතුරු ඉදිරිපත් කරයි. | • වන්නම්වල පසුබිම හා විකාශනය අධ්‍යයනය | 02 |
| | 5.0 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි. | **5.3** **කෝළම් නාටක පිළිබඳ තොරතුරු අධ්‍යයනය කරමු.** | ▪ කෝළම් නාටක ප්‍රචලිත ප්‍රදේශ නම් කරයි.<br>▪ කෝළම් නාටක පැවැත්වීමේ අතීත හා වර්තමාන හේතු සාකච්ඡා කරයි.<br>▪ කෝළම් නාටකවල නර්තන, ගායන, වාදන, රංග භූමිය හා රංග වස්ත්‍රාභරණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>▪ මෙම නාටකවලින් සමාජ විවරණයන් සිදු වන බව ප්‍රකාශ කරයි. | • කෝළම් නාටකය පිළිබඳ තොරතුරු අධ්‍යයනය | 02 |
| | 6.0 රසඥතා වර්ධනව සඳහා විවිධ කලාංගවල සුවිශේෂී ලක්ෂණ විචාරයට ලක් කරයි. | **6.1** **රූපවාහිනී නාලිකාවල විකාශය වන අද්‍යතන නර්තන වැඩසටහන් අගයමු.** | ▪ රූපවාහිනී නාලිකාවල විකාශය වන අද්‍යතන නර්තන වැඩසටහන් නම් කරයි.<br>▪ එම වැඩසටහන්වල දක්නට ලැබෙන නර්තන අංග පිළිබඳ අදහස් දක්වයි.<br>▪ නර්තනය විචිත්‍රවත් කිරීමට යොදාගත් ක්‍රමෝපායයන් පිළිබඳ සාකච්ඡා කරයි. | • රූපවාහිනී නාලිකාවල විකාශය වන අද්‍යතන නර්තන වැඩසටහන් | 02 |
| 11 ශ්‍රේණිය 11 වන වාරය | 1.0 පරිසර නිරීක්ෂණයෙන් | **1.2** **තේමාවක් අනුව චරිත නිරූපණය කරයි.** | ▪ චරිත නිරූපණයට සුදුසු සිද්ධියක් ගොඩ නගයි. | • විවිධ චරිත නිරූපණය (තේමාවක් අනුව චරිත නිරූපණය) | 03 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ලබන අත්දැකීම් ඇසුරු කර ගනිමින් නර්තන නිර්මාණ කරයි. | | ▪ නර්තන මාධ්‍ය කොටගෙන චරිත නිරූපණය කරයි.<br>▪ විවිධ භාව ප්‍රකාශවන පරිදි චරිත නිරූපණයේ යෙදෙයි.<br>▪ තේමාවක් අනුව චරිත නිරූපණයේ යෙදෙයි. | | |
| | 1.0<br>පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කර ගනිමින් නර්තන නිර්මාණ කරයි. | **1.3**<br>**කඩු/ මෝල්ගස් නැටුමක් නිර්මාණය කරමු.** | ▪ කඩු/ මෝල්ගස් නැටුමේ සුවිශේෂ ලක්ෂණ හඳුන්වයි.<br>▪ කඩු/ මෝල්ගස් නැටුමට උචිත චලන නිර්මාණය කරයි.<br>▪ කඩු/ මෝල්ගස් නර්තන නිර්මාණ පිළිබඳ විචාරාත්මකව අදහස් දක්වයි. | • කඩු/ මෝල්ගස් නැටුම සුවිශේෂ ලක්ෂණ<br>• නර්තන නිර්මාණය | 02 |
| | 3.0<br>සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනාගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශන කරයි. | **3.1, 3.2**<br>**බෙර සරඹ හා බෙර පද වාදනය** | ▪ බෙර සරඹ තාල තබමින් කියයි.<br>▪ බෙර වාදන ශිල්පක්‍රම අනුගමනය කරමින් ත්‍රිවිධ ලය අනුව සරඹ වාදනය කරයි.<br>▪ මැදුම් මහ දෙතිතට අයත් බෙර පද තාල තබා කියයි.<br>▪ මැදුම් මහ දෙතිතට අයත් බෙර පද වාදනය කරයි.<br>▪ සාමූහිකව බෙර වාදනයේ යෙදෙයි. | • 1- 3 දක්වා බෙර සරඹ අභ්‍යාසය<br>• මැදුම් මහ දෙතිතට බෙර/ දවුල් පද වාදනය<br>• 8 ශ්‍රේණියේ ඉගෙන ගත් බෙර පද වාදනය | 04 |
| | 5.0<br>ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි. | **5.1.2**<br>**නර්තන කලාවේ නූතන ප්‍රවණතා අධ්‍යයනය** | ▪ අධ්‍යාපනික වශයෙන් ඇති වූ නව ප්‍රවණතා විස්තර කරයි.<br>▪ සමාජයීය අවශ්‍යතා සඳහා නර්තනය යොදා ගන්නා අයුරු සාකච්ඡා කරයි.<br>▪ නූතන තාක්ෂණ භාවිතය මගින් නර්තන ප්‍රාසාංගික ව ඉස්මතු කොට දැක්විය හැකි බවට කරුණු ඉදිරිපත් කරයි.<br>▪ විවිධ නර්තන, නව නිර්මාණ බිහිවීම නර්තන කලාවේ ප්‍රගමනයට ඉවහල් වී ඇති බවට තොරතුරු ඉදිරිපත් කරයි.<br>▪ ව්‍යවහාරික නර්තන, සමාජ සංස්කෘතිය හා ආර්ථික අංග කෙරෙහි බලපාන අයුරු සාකච්ඡා කරයි. | • උඩරට, පහතරට, සබරගමු නර්තන සම්ප්‍රදායට අයත් ලේඛන කෘති හඳුනා ගැනීම.<br>මහාචාර්ය මුදියන්සේ දිසානායක<br>මහාචාර්ය තිස්ස කාරියවසම්<br>මහාචාර්ය ශ්‍රියානි රාජපක්ෂ | 03 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 11 ශ්‍රේණිය<br>111 වන වාරය | 2.0<br>නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | **2.4**<br>**රස හා භාව හඳුනා ගනිමු.** | ▪ නව නළු රස නම් කරයි.<br>▪ භාව නවය නම් කරයි.<br>▪ රස හා භාව හඳුනා ගනිමින් ඒ පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි.<br>▪ භාව නිරූපණය කිරීමේදී මුහුණේ ඉරියව්වල වෙනස්කම් විස්තර කරයි. | • රස හා භාව පිළිබඳ විස්තර | 02 |
| | 2.0<br>නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | **2.5**<br>**ගැමි නැටුම් පිළිබඳ විමසමු.** | ▪ සිංහල හා දෙමළ ගැමි නැටුම් පිළිබඳ සංස්කෘතික පසුබිම විස්තර කරයි.<br>▪ සිංහල හා දෙමළ ගැමි නැටුම් පිළිබඳ තුලනාත්මක ලක්ෂණ විස්තර කරයි. | • නර්තන අංග භාවිත වන අවස්ථා<br>• ගායන, වාදන, රංගවස්ත්‍රාභරණ, රංග උපකරණ විස්තරාත්මකව | 02 |
| | 2.0<br>නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | **2.6**<br>**කලාවන් හඳුනා ගනිමු.**<br>**(චිත්‍ර, සංගීත, නාට්‍ය, නර්තන කලා)** | ▪ චිත්‍ර, සංගීත, නාට්‍ය, නර්තන කලා යනු කුමක්දැයි හඳුන්වයි.<br>▪ චිත්‍ර, සංගීත, නාට්‍ය, නර්තන කලා අතර පවතින අන්‍යෝන්‍ය සම්බන්ධතාව විස්තර කරයි.<br>▪ චිත්‍ර, සංගීත, නාට්‍ය, නර්තන කලා ඉදිරිපත් කිරීමේ ක්‍රම විධි සාකච්ඡා කරයි.<br>▪ චිත්‍ර, සංගීත, නාට්‍ය, නර්තන කලා අංගයක් උදාහරණයට ගෙන තොරතුරු ඉදිරිපත් කරයි. | • චිත්‍ර, සංගීත, නාට්‍ය | 03 |
| | 6.0<br>රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි. | **6.2**<br>**මණිපුරි නර්තන සම්ප්‍රදාය පිළිබඳ තොරතුරු රැස් කරමු.** | ▪ මණිපුරි නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ නම් කරයි.<br>▪ මණිපුරි නර්තන සම්ප්‍රදායේ ආගමික පසුබිම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>▪ නර්තන, සංගීතය, වාද්‍ය භාණ්ඩ හා රංගවස්ත්‍රාභරණවල විශේෂ ලක්ෂණ සාකච්ඡා කරයි. | ▪ මණිපුරි නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ, නර්තන, සංගීතය, වාද්‍ය භාණ්ඩ හා රංගවස්ත්‍රාභරණ | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | 8.2<br>**නර්තන කලාවේ සමාජයීය වටිනාකම** | ▪ නර්තනය හා සබැඳි කටයුතුවල නිරතවීමෙන් සහජීවනය හා මානව සම්බන්ධතා ගොඩ නැඟෙන බව ප්‍රකාශ කරයි.<br>▪ කණ්ඩායම් වශයෙන් කටයුතු කිරීමේදී නායකත්ව ගුණාංග වර්ධනය කරගත හැකි බව සාකච්ඡා කරයි.<br>▪ දේශීය සංස්කෘතික අංග ඊදිරිපත් කිරීම මගින් අන්තර්ජාතික සබඳතා ගොඩනැගෙන බව විස්තර කරයි.<br>▪ වේදිකා ප්‍රසංග මගින් විනෝදාස්වාදය සහ කලා නිර්මාණ වර්ධනය වන බවට තොරතුරු ඉදිරිපත් කරයි.<br>▪ සමාජගත පොදු සිරිත් විරිත් (චාරිත්‍ර, වාරිත්‍ර) නර්තන කලාවේ දී භාවිතයට ගනියි. | • සහජීවනය හා නායකත්ව ගුණාංග<br>• අන්තර්ජාතික සබඳතා<br>• සමාජ සම්බන්ධතා<br>• වේදිකා ප්‍රසංග | 03 |
| | | | | | 36 |